# සීමාසහිත හාරිස්පත්තුව දකුණ විවිධ සේවා සමුපකාර සමිතිය

# සාමාන්‍යාධිකාරී තනතුර සඳහා අයදුම්පත් කැඳවීම

සීමාසහිත හාරිස්පත්තුව දකුණ විවිධ සේවා සමුපකාර සමිතියේ සාමාන්‍යාධිකාරී තනතුර සඳහා මධ්‍යම පළාත තුළ ස්ථිර පදිංචි සුදුසුකම්ලත් අයදුම්කරුවන්ගෙන් 2025.12.02 දක්වා අයදුම්පත් කැඳවනු ලැබේ.

## (01) සාමාන්‍යාධිකාරී iii - (පුරප්පාඩු තනතුරු 01)

**වැටුප් පරිමාණ අංක :** H.L. 01 : 01

**වැටුප් පරිමාණය** : 46,800 - 755 X 10 - 1,135 X 10 - 1,510 X 10 = 80,850

**වයස් සීමාව** : අවුරුදු 18 - 50

(මෙම වයස් සීමාව සමුපකාර සේවයේ නියුතු අයට අදාළ නොවේ)

**සුදුසුකම්** :

අ. නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී II ශ්‍රේණියේ වසර 03 ක ස්ථිර සේවා පළපුරුද්දක් / සහකාර සාමාන්‍යාධිකාරී (මුදල්) තනතුරක වසර 05 ක් / සහකාර සාමාන්‍යාධිකාරී (බැංකු) වසර 05 ක ස්ථිර සේවා පළපුරුද්දක් / සහකාර සාමාන්‍යාධිකාරී (වාණිජ) තනතුරක වසර 06 ක ස්ථිර සේවා පළපුරුද්දක් / සහකාර සාමාන්‍යාධිකාරී (පිරිස්) තනතුරක වසර 06 ක ස්ථිර සේවා පළපුරුද්දක් තිබීම

හෝ

ආ. පිළිගත් විශ්වවිද්‍යාලයක උපාධියක් සමත් වී තිබීම. (රාජ්‍ය පරිපාලනය / කළමනාකරණය / වාණිජ / ව්‍යාපාර පරිපාලනය / ආර්ථික විද්‍යාව යන ක්ෂේත්‍රයක උපාධියක් සඳහා වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ) / උසස් තාක්ෂණ ආයතනයේ ගණකාධිකරණය / ව්‍යාපාර පරිපාලනය / මානව සම්පත් කළමනාකරණය යන ඩිප්ලෝමාවන්ට අදාළව වසර 2 1/2 ක පාඨමාලාවක් සමත් වී තිබීම

හෝ

ඇ. සමුපකාර සංවර්ධන ආයතනය / පිළිගත් ආයතනයක සමුපකාර ව්‍යාපාරයට අදාළ විෂයයන් ඇතුළත් මාස 09 කට නොඅඩු අධ්‍යයන කාලයක් සහිත ඩිප්ලෝමා පාඨමාලාවක් සමත් වීම / පිළිගත් විශ්වවිද්‍යාලයක් මගින් පවත්වනු ලබන සමුපකාර ව්‍යාපාරයට අදාළ මාස 09 කට නොඅඩු අධ්‍යයන කාලයක් සහිත ඩිප්ලෝමාවක් සමත් වීම සමග නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී II ශ්‍රේණියේ වසර 02 ක ස්ථිර සේවා පළපුරුද්දක් / සහකාර සාමාන්‍යාධිකාරී (මුදල්) තනතුර වසර 03 ක් / සහකාර සාමාන්‍යාධිකාරී (බැංකු) වසර 03 ක ස්ථිර සේවා පළපුරුද්දක් / සහකාර සාමාන්‍යාධිකාරී (වාණිජ) තනතුරක වසර 03 ක ස්ථිර සේවා පළපුරුද්දක් / සහකාර සාමාන්‍යාධිකාරී (පිරිස්) තනතුරක වසර 03 ක ස්ථිර සේවා පළපුරුද්දක් තිබීම.

නියමිත අයදුම්පත්‍රය සමුපකාර සමිතියේ ප්‍රධාන කාර්යාලයට රුපියල් 300/- ක් ගෙවා ලබාගත හැකිය. නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත සමග උප්පැන්න සහතිකය, අධ්‍යාපන සහතික, පළපුරුද්ද පිළිබඳ සහතික, ග්‍රාම නිලධාරී සහතිකය, චරිත සහතිකය, ජාතික හැඳුනුම්පත යනාදියේ සහතික කළ ඡායා පිටපත් සමග "ගරු සභාපති, සීමාසහිත හාරිස්පත්තුව දකුණ විවිධ සේවා සමුපකාර සමිතිය, හැදෙණිය, වැරැල්ලගම" යන ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් එවිය යුතුය. ලිපි කවරයේ වම්පස ඉහළ කෙළවරේ අයදුම්කරන තනතුර සඳහන් කළ යුතුය.

**ගරු සභාපති,**
**සීමාසහිත හාරිස්පත්තුව දකුණ විවිධ සේවා සමුපකාර සමිතිය,**
**හැදෙණිය, වැරැල්ලගම.**
**2025.11.07**
**දුරකථනය : 081-2461769 / 081-2461774 / 081-2460733**